# ලොව වටා පුවත් වියමන

*ලෝකයේ එක් කුඩා රටක් උත්සවශ්‍රියෙන් ඇළලී යද්දී තවත් බොහෝ රටවල් අවුලෙන් සහ තැවුලෙන් ඇළලී ගිය මාසයක් බවට ගෙවීගිය අප්‍රේල් මාසය පත්විය. සිංහල අලුත් අවුරුද්ද හේතුවෙන් උත්සවශ්‍රීයෙන් ඇළළී ගියේ ශ්‍රී ලංකාවය. කොයි කවුරුත් සරු කරගන්නට වෙහෙසුන අලුත් අවුරුද්ද වඩාත් සරුවී තිබුණේ ආණ්ඩු පක්ෂයේ දේශපාලකයන්ටය. අප්‍රේල් 8 දා පැවති පාර්ලිමේන්තු මහ මැතිවරණයෙන් ආණ්ඩු පක්ෂය තුනෙන් දෙකකට ආසන්න වැඩි පාර්ලිමේන්තු ආසන ප්‍රමාණයක් ලබාගෙන ජයග්‍රහණය කර තිබීම ඊට හේතුවිය.*

## බක්මහේ අකුණු

ශ්‍රී ලංකාවට ප්‍රීතිමත් දිනයක් වූ අප්‍රේල් 14 චීනයට බෙහෙවින් ශෝක ජනක දිනයක් බවට පත්වුයේ බටහිර චීනයේ සිදුවූ බලවත් භූමිකම්පාවක් හේතුවෙනි. කුයින්ග්හායි ප්‍රදේශයේ සිදුවූ එම භූමිකම්පාවෙන් අඩුතරමින් 760 ක් ජීවිතක්ෂයට පත්ව 300 ක් පමණ අතුරුදහන්ව 9000 කට අධික පිරිසක් තුවාල ලැබූහ. රිච්ටර් මාපකයේ 6.9 ක් වූ භූමිකම්පාවෙන් යුෂු නගරය ඇසිල්ලකින් සුන්බුන් ගොඩක් බවට පත්වූ අතර අධික ශීතල සහ එම ප්‍රදේශයට ළඟාවීමට ඇති ගමනාගමන අපහසුතා නිසා විපතට පත්වූවන් බේරාගැනීමේ මෙහෙයුම් දියත් කිරීමට බාධා සිදුවිය.

බක්මහේ ශෝක ජනක සිදුවීම් අතරින් ප්‍රමුඛ ස්ථානයක් හිමිවූයේ පෝලන්ත ජනාධිපතිවරයාට මරු කැඳවමින් සිදුවූ ගුවන් අනතුරටයි. පෝලන්ත ජනාධිපති ලෙක් කැසින්ස්කි, ජනපති ආර්යාව





මාරියා කැසින්ස්කි ඇතුළුව එරට ජ්‍යෙෂ්ඨ ඇමැතිවරුන් ආරක්ෂක අංශ ප්‍රධානීන් රැසකට මරු කැඳවමින් ඔවුන් ගමන්ගත් රුසියාවේ නිෂ්පාදිත ටී.යූ. 154 ජෙට් යානය අනතුරට ලක්වූයේ අප්‍රේල් 10 වෙනි සෙනසුරාදාය. දෙවන ලෝක යුද්ධයේදී ස්ටාලින්ගේ හමුදාව විසින් ඝාතනය කරනු ලැබූ පෝලන්තයේ හමුදා සාමාජිකයන් අනුස්මරණය කිරීම සඳහා එම ඝාතන සිදුවූ රුසියාවේ ස්මොලෙන්සික් කලාපයේ කැටින් ප්‍රදේශයට යමින් සිටියදී මෙම අනතුර සිදුවී තිබුණේ ගුවන් නියමුවන්ගේ නොසැළකිල්ල නිසා බව පසුව අනාවරණය විය. යානයේ ගමන්ගත් මගීන් 96 දෙනාම ජීවිතක්ෂයට පත්වූ අතර ඔවුන් සියළු දෙනාම පාහේ පෝලන්ත රජයේ ඉහළ නිල දැරූවන් විය. මේ හේතුවෙන් පෝලන්තය සතියක ශෝක කාලයක් ප්‍රකාශයට පත්කරනු ලැබූ අතර කථානායකවරයා වැඩබලන ජනාධිපතිවරයා වශයෙන් පත්කරගනු ලැබීය. එරට ව්‍යවස්ථාව අනුව දැන් කඩිනමින් මැතිවරණයක් පවත්වා නව ජනපතිවරයෙකු තෝරාපත්කර ගත යුතුව තිබේ. මිලියන ගණනක ජනතා සහභාගීත්වයෙන් 18දා ජනාධිපතිවරයාගේ අවසන් කටයුතු සිදුකෙරුණ අතර ඒ වන විට යුරෝපය හරහා ගමන් කරන සියළු ගුවන් ගමන් අත්හිටුවා තිබීම හේතුවෙන් පෝලන්ත ජනාධිපතිවරයාට අවසන් ගෞරව දැක්වීමට එහි යාමට බොහෝ රාජ්‍ය නායකයන්ට නොහැකිවිය.

## අයිස්වල ගිනි සැර

බක් මහේ ලෝකය අවුලෙන් අවුලට පත්කළ ප්‍රධාන සිදුවීම වාර්තා වූයේ ප්‍රවාහන ක්ෂේත්‍රයෙනි. මෑත ඉතිහාසයේ ලොව ප්‍රවාහන කටයුතු බරපතලම අර්බුධයකට පත්වූ අවස්ථාව ලෙස මෙය සැළකිය හැකිය. අර්බුදයට මුල්වුණේ අයිස්ලන්තයේ කැට්නා ගිනි කන්ද සක්‍රීයවීමය. ඉන් පිටතට ගලන ලාවා හේතුවෙන් අවට මුහුදේ ගැලැසියර දියවී ගොඩබිම් ප්‍රදේශ ජලයෙන් යටවන්නට පටන් ගනිද්දී අහසට විහිදුණු ඝන අළු වළාව ක්‍රමක්‍රමයෙන් ඉහළ අහසේ විශාල ප්‍රදේශයක් වසා පැතිරී යන්නට විය. අළු වළාව උතුරින් ආක්ටික් වෘත්තය දක්වාත්, දකුණින් මධ්‍යධරණී මුහුද දක්වාත්, ස්පාඤ්ඤය හා රුසියාව දක්වාත් පැතිරගොස් තිබිණ. මීටර් හයදාහ සිට එකොළොස්දාහක් දක්වා දුරකට අළු වලාව විහිදී යද්දී එම ප්‍රදේශයට ඉහළින් සිදුකරන ගුවන් ගමන්වලට එල්ලවිය හැකි අවදානම සළකා සියළු ගුවන් ගමන් නවතා, ලොව කාර්ය බහුලම ගුවන් තොටුපොළ ලෙස සැළකෙන එංගලන්තයේ හීත්රෝ ජාත්‍යන්තර ගුවන් තොටුපොළ ඇතුළුව ඩෙන්මාර්ක්, බෙල්ජියම, නෙදර්ලන්තය, නෝර්වේ, පින්ලන්තය, ප්‍රංශය, ජර්මනිය, පෘතුගාලය, ස්පාඤ්ඤය, ස්වීඩනය යන යුරෝපා රටවල ගුවන් තොටුපොළ රැසක් අප්‍රේල් 15 දා සිට වසා දමන්නට ගුවන් ආරක්ෂක බලධාරීහු පියවර ගත්හ. තත්ත්වය යහපත් වෙන්නට සතියක් පමණ ගතවිය. 15දා වසා දැමුණු ලන්ඩන් හීත්රෝ ගුවන් තොටුපොළේ කටයුතු යළි සම්පූර්ණයෙන්ම ආරම්භ කරන ලද්දේ අප්‍රේල් 21 දාය. ඉන් පසුව ක්‍රමයෙන් ගුවන් ගමන් යථා තත්ත්වයට පත්වන්නට වුවත් අප්‍රේල් 25 වන විටත් නෝර්වේ ඇතුළු රටවල් කිහිපයක ගුවන් ගමන් යථා තත්ත්වයට පත්ව තිබුණේ නැත. ඒ වන විට ලොව පුරා රටවල අවලංගු කර තිබූ ගුවන් ගමන් වාර සංඛ්‍යාව ලක්ෂයක් පමණ වූ අතර මේ හේතුවෙන් සිදුවූ පාඩුව ඇමරිකා ඩොලර් බිලියන 1.7 ක් බවට ඇස්තමේන්තු කර තිබුණි. ගුවන් මගීන් දස ලක්ෂ ගණනක් විවිධ හිරිහැරවලට මුහුණ පා සිටියහ.

## අභියෝග ජයගත් ආදරය

ලෝකයේ කිසිමයම් හෝ ගුවන් තොටුපොළක් ගුවන් ගමන් සඳහා මිස මංගල උත්සව සඳහා යොදාගැනීමක් පිළිබඳ මින් පෙර අසා තිබූ බවක් මගේ මතකයේ නැත. ගුවන් තොටුපොළකදී සිදුවූ විවාහයක් පිළිබඳ අපූරු පුවතක් වාර්තා වූයේ අප්‍රේල් 17 වැනිදා ඩුබායි රටෙනි. විවාහය සඳහා පහසුකම් සපයනු ලැබුයේ අන්තර් ජාලයෙනි. බ්‍රිතාන්‍ය ජාතික ෂෝන් මර්ටොග් මනාලයා වූ අතර ඔහුගේ අත ගත්තී 'නටලී' ඔස්ට්‍රේලියානු තරුණියකි. දෙපළ ඔස්ට්‍රේලියාවේ බ්‍රිස්බෙන් සිට ලන්ඩන් බලා පියාසර කරමින් සිටියේ එහි වෙසෙන සිය ඥාතීන් හමුවේ උත්සවශ්‍රියෙන් සිය විවාහය සිදුකිරීමට වුවද කැට්නා ගිනි කන්දේ අළු වලාව හේතුවෙන් යුරෝපයේ ගුවන් ගමන් හිටි අඩියේ නතර වීමත් සමග දෙදෙනා ඩුබායි ගුවන් තොටුපොළේ සිර වූයේ නොසිතූ ලෙසිනි. අවසානයේ මංගල දිනය උදාවන තුරුත් ඔවුන්ට ලන්ඩන් යන්නට ඉඩ නොලැබුණි. කවර අභියෝග හමුවේ වුවද ගුවන් ගමන් කාලසටහන් වෙනස් කළ ආකාරයෙන් සිය ජීවිත කාලසටහන වෙනස් කරන්නට තමන් සූදානම් නැති බව ලොවට පෙන්වාදෙමින් මේ පෙම්වතුන් ගුවන් තොටුපොළේ සිරවී සිටියදීම අන්තර් ජාලයේ සහාය ලබාගෙන ලන්ඩනයේ සිටින නෑ හිතමිතුරන් සමග එක්වී විවාහ උත්සවය පැවැත්වූහ.

මෙවැනිම අභියෝග ජයගත් ප්‍රේමවන්තයින් යුවළක් අප්‍රේල් 15 දින ලොවටම ඇසෙන්නට මංගල කිංකිණි හැඬවූහ. සානියා හා ෂොහිබ් ඒ පෙම් යුවළයි. උපතින් මුස්ලිම් ජාතිකයන් වන ඉන්දීය ටෙනිස් ශූරී සානියා මිර්සා සහ පාකිස්ථාන් ක්‍රිකට් ක්‍රීඩක ෂොහිබ් මලික් දෙදෙනාගේ විවාහය නිල වශයෙන් මාධ්‍යයට ප්‍රකාශ කළේ මාර්තු මස අවසානයේදීය. දෙරටේ මහත් ආන්දෝලනයක් ඇති කළ එම පුවතින් පසු ඔවුන්ගේ විවාහයට විරෝධය පළකරමින් දෙරටේම විවිධාකාර විරෝධතා පවා පැවැත්වුණි. එහෙත් අවසානයේ සියළු බාධක බිඳ ඉන්දියාවේ හයිද්‍රාබාද් නුවරදී දෙදෙනා යුග දිවියට පිවිසියහ. එය එක්තරා ආකාරයකින් 'මයි නේම් ඉස් ඛාන්' චිත්‍රපටයේ නිෂ්පාදකවරුන් ලද ජයග්‍රහණය හා සමානය. සෙමින් මනස වැඩෙන රිස්වාන් ඛාන් නමැති මුස්ලිම් ජාතික තරුණයෙක් කතා නායකයා කරගනිමින් දේශපාලනමය දෘෂ්ඨි කෝණයකින් නිෂ්පාදනය කර ඇති මේ චිත්‍රපටිය ප්‍රදර්ශණයට දින නියම කිරීමත් සමග එය ප්‍රදර්ශණය කිරීම නතර කරන ලෙස ඉල්ලා අන්තවාදී කණ්ඩායම් විසින් බලවත් ආකාරයේ විරෝධතා ව්‍යාපාර දියත් කළ අතර චිත්‍රපටය ප්‍රදර්ශණයට නිදහස් කෙරුණේ ඉන්දියාවේ සිනමාශාලා වලට විශේෂ පොලිස් ආරක්ෂාවක්ද සපයමිනි. එසේ වුවද මේ වන විට එම චිත්‍රපටය ඉන්දීය සිනමා ඉතිහාසයේ සියළු ආදායම් වාර්තා බිඳ හෙළමින් ප්‍රදර්ශණය කෙරෙමින් පවතියි.

## දෙවියන්ගේ දඩුවම්

ජාතිවාදය. ආගම්වාදය ඉස්මතු කරමින් මිනිසුන් විසින් නිර්මාණය කරනු ලබන මෙවැනි කුණාටු ඉන්දියාවත් පාකිස්ථානයත් අතරින් හමා යෑම දැන් සාමාන්‍ය දෙයක් දෙයක් බවට පත්ව තිබේ. එහෙත් ඉන්දියාවත් බංග්ලාදේශයත් හරහා නිතර ඇදී යන්නේ ස්වාභාව ධර්මය විසින් නිර්මාණය කරන කුණාටුය. අප්‍රේල් 13 වනදා පැයට කිලෝ මීටර් 120 ක වේගයෙන් එලෙස හමාගිය කුණාටුවකින් දෙරටේ පුද්ගලයන් 120 ක්



ජීවිතක්ෂයට පත්ව තවත් සිය ගණනක් තුවාල ලැබූහ. ඉන්දියාවේ ඇතැම් ආගමිකයන් මේවා සළකන්නේ දෙවියන් කෝපවීමක් වශයෙනි.

නැගෙනහිර ඉන්දියාවේ චට්ස්ගාර් ප්‍රාන්තයේ දාන්තෙවාදා හි දී මාවෝවාදී කැරළිකරුවෝ එල්ල කළ ප්‍රහාරයකින් මුර සංචාරයේ යෙදී සිටි පොලිස් භටයන් 75 ක් පමණ ජීවිතක්ෂයට පත්ව 20 ක් පමණ තුවාල ලැබුවේ අප්‍රේල් 4 දාය. ප්‍රහාරයෙන් අනතුරුව මාවෝවාදීන්ට එරෙහිව හමුදා යෙදවීමට ඉන්දීය රජය මුලින් අවධානය යොමු කළද එයින් වඩාත් නරක ප්‍රතිඵළ ඇතිවිය හැකි බවට රහස් ඔත්තු සේවා අනතුරු ඇඟවූයෙන් ඒ අදහස නැවත සළකා බලන තැනකට ඉන්දියාව යොමුවිය. මාවෝවාදීන්ගේ ක්‍රියාකාරකම් ඉන්දියාව තුළ හිස ඔසවන්නට පටන් ගැනීම එරට මුහුණ පා සිටින අලුත්ම අභියෝගයයි. දැන් ඉන්දියාව සිටින්නේ මේ අභියෝගය ජය ගන්නා ආතාරයක් ගැන සිතමිනි.

අප්‍රේල් මාසය ඇරඹෙන්නේද ලෝකයේ විවිධ රටවලින් ත්‍රස්තවාදී ප්‍රහාර පිළිබඳ ලැබෙන වාර්තාත් සමගිනි. පෙරවරුවේ රුසියාවේ මොස'කව් නුවර උමං දුම්රියක් ඉලක්ක කරගනිමින් එල්ල කෙරුණු මරාගෙන මැරෙන බෝම්බ ප්‍රහාර දෙකකින් පුද්ගලයන් 36 ජීවිතක්ෂයට පත්ව තවත් පිරිසක් තුවාල ලැබූවේ මාර්තු 29 දිනය. මධ්‍යම මොස්කව් හි ලුබියන්කා දුම්රිය ස්ථානයේ සහ පර්ග් කුග්ටූරි දුම්රිය ස්ථානයේ නවතා තිබූ දුම්රිය දෙකක් ඉලක්ක කරගනිමින් ප්‍රහාර එල්ල කරනු ලැබුවේ මරාගෙන මැරෙන බෝම්බකාරියන් දෙදෙනෙකු විසිනි.

රුසියාවේ කොකේෂස් ප්‍රදේශයට එල්ලවූ මරාගෙන මැරෙන බෝම්බ ප්‍රහාර දෙකකින් 12 ක් ජීවිතක්ෂයට පත්ව තවත් පිරිසක් තුවාල ලබන්නේ මෙහි උණුසුම පහව යන්නටත් මත්තෙනි. එම ප්‍රදේශයේ අන්තවාදී මුස්ලිම් සංවිධානයක් ප්‍රහාරයේ වගකීම බාර ගත් අතර ඉදිරියටත් මෙවැනි ප්‍රහාර සිදුකරන බව ප්‍රකාශ කර තිබුණි. උතුරු කොකේෂස්හි ඉස්ලාමීය අන්තවාදීන්ට එරෙහිව රුසියාව වසර කිහිපයක සිට සටන් වැද සිටින අතර පෙබරවාරි 11 දින එහි ගම් දෙකකට රුසියන් හමුදා එල්ල කළ ප්‍රහාරයට පළිගැනීමක් ලෙස මෙම ප්‍රහාර සිදුකර තිබේ.

## රතු කමිස සහ කහ කමිස

ඉකුත් මාසය තායිලන්ත දේශපාලන අර්බුදය තවදුරටත් නරක අතට හැරෙන ලකුණු ප්‍රකට කළේය. බැංකොක් අගනුවර ස්ථාන කිහිපයක අප්‍රේල් 23 දා සිදුවූ බෝම්බ පිපිරීම්වලින් තිදෙනෙකු ජීවිතක්ෂයට පත්ව සියයකට ආසන්න පිරිසක් තුවාල ලැබූහ. අගමැතිවරයාට ඉල්ලා අස්වන ලෙස හා මහ මැතිවරණයක් පවත්වන ලෙස මාස ගණනක් තිස්සේ තායිලන්ත පාලනාධිකාරියට බල කරමින් අගමැති තක්සින් සිනවත්‍රාට පක්ෂපාතී 'රතු කමිසකරුවෝ' බැංකොක්හි කඳවුරු බැඳ සිටින්නේ සති කීපයක සිටය. තායිලන්ත රජයත් නව අගමැති අබිසිට් වෙජ්ජජිවාට පක්ෂපාතී කහ කමිසකරුවෝත් රතු කමිසකරුවන්ට එරෙහිව සටනට පිවිස සිටිති. රතුකමිසකරුවෝ පන්දහසක් පමණ අප්‍රේල් 7 දා එරට පාර්ලිමේන්තුව වට කිරීම නිසා එහි සිරවී සිටි මැති ඇමැතිවරුන් පිටතට ගැනීමට සිදුවූයේ හෙලිකොප්ටර් යානා යොදවමිනි. ඒ වන විට පාර්ලිමේන්තු සැසිය පැවැත්වෙමින් තිබූ අතර අගමැතිවරයා සුළු වේලාවකට පෙර පාර්ලිමේන්තුවෙන් ඉවත්ව ගොස් තිබිණ. රතුකමිසකරුවන්ට සහාය පළකරන බවට චෝදනා කරමින් එරට පීපල්ස් චැනල් නමැති රූපවාහිනී විකාශය අප්‍රේල් 8 වනදා සිට තහනම් කිරීමට රජය පියවර ගත්තේය. රතු කමිසකරුවෝද ඊට බරපතල ආකාරයේ ප්‍රතිචාරයක් දක්වමින් අප්‍රේල් 24 දා ජනාධිපතිවරයා ජාතිය අමතා කළ කතාව එරට රූපවාහිනී නාලිකා තුළින් විකාශය වෙද්දී චන්ද්‍රිකා සංඥාවලට බාධා පමුණුවා විකාශන කටයුතු අඩාල කළහ. පසුව අගමැතිවරයා ප්‍රකාශ කළේ රතු කමිසකරුවන් සිය ප්‍රචණ්ඩ ක්‍රියා නොනවත්වන්නේ නම් ඔවුන්ට එරෙහිව හමුදාව යෙදවීමට ක්‍රියා කරන බවයි.

එළැඹෙන සැප්තැම්බර් මස 18 වැනිදා පැවැත්වීමට නියමිත අෆ්ගන් මහ මැතිවරණය දූෂණයෙන් තොරව පැවැත්වීමේ අරමුණින් ජනාධිපති කර්සායි විසින් පත්කරනු ලැබූ නව මැතිවරණ කොමසාරිස් ෆාසල් අහ්මඩ් මනාවි අප්‍රේල් 22දා සිය ධූරයේ දිවුරුම් දුන්නේය. මනාවි ඉස්ලාමීය ෂර්යා නීතිය පිළිබඳ මහාචාර්යවරයෙකි. ඔහුගේ පත්වීම සම්බන්ධයෙන් කාබුල් අගනුවර එක්සත් ජාතීන්ගේ නියෝජිතයා ප්‍රසංශාව පළකර තිබිණි. අෆ්ගනිස්ථානයේ ස්වාධීන මැතිවරණ කොමිසමක් පැවතියද ඉකුත් මැතිවරණය




ශ්‍රීලාල් සෙනෙවිරත්න

දූෂණයෙන් පිරීගිය එකක් වූ බව දෙස් විදෙස් මැතිවරණ නිරීක්ෂකයෝ ප්‍රකාශ කර තිබිණි. ස්වාධීන මැතිවරණ කොමිසම ශක්තිමත් කිරීමෙහිලා කර්සායි දැක්වූ උනන්දුව ඒ ප්‍රතිචාරවලටත් වඩා අමෙරිකා ජනාධිපති ඔබාමාගේ ඉල්ලීමට දැක්වූ ප්‍රතිචාරයක් බව සිතිය හැකිය.

## ඔබාමාගේ රහස් සංචාරය

ඉකුත් මාර්තු 28 මැදියමේ ඔබාමා රහසිගතව ඇෆ්ගනිස්ථානයට පැමිණ ජනාධිපති කර්සායි සහ ඇමරිකා හමුදා භටයන් හමුවිය. සිය හමුදා සාමාජිකයන්ට ස්තුති කිරීමත්, දූෂණ නවත්වන ලෙස කර්සායිට බලපෑම් කිරීමත් අරමුණු කරගෙන මෙම සංචාරය සිදුකළ බව ප්‍රකාශ විය. ජනපති ඔබාමාගේ ප්‍රථම ඇෆ්ගන් සංචාරය මෙය වූ අතර සංචාරය පැය පහක් වැනි කෙටි කාලයකට පමණක් සීමා විය. එහෙත් ඒ සඳහා පැය විසිහතරක කාලයක් ගුවනේ ගත කරන්නට ඔබාමාට සිදුවී තිබිණී. සිය නායකයා දැකගැනීමට ඇෆ්ගනිස්ථානයේ සිටින ඇමරිකා සෙබළුන් 2000 ක් පමණ බර්ගන් ගුවන් හමුදා කඳවුරට පැමිණ සිටියහ. වසර අටක් ගතවී ඇති ඇෆ්ගන් යුද්ධය අවසන් කර ලබන වසර අවසානය වන විට හමුදා ආපසු සිය රට කැඳවීමේ බලාපොරොත්තුවෙන් ඔබාමා කටයුතු කරගෙන යයි. පසුගිය වසරේ පැවැති ජනාධිපතිවරණයෙන් නැවතත් ජනාධිපති ධූරයට පත් කර්සායිගේ පාලනය සැළකෙන්නේ දූෂණයෙන් පිරීගත් එකක් වශයෙනි. කර්සායි දෙවැනිවර ජනාධිපතිධූරයට පත්වීමෙන් පසු විසිපස් දෙනෙකුගෙන් යුත් කැබිනට් මණ්ඩලයක් නම්කර පාර්ලිමේන්තු අනුමැතියට ඉදිරිපත් කළද